

ආචාර්ය
තරංග චින්තන
දන්දෙනිය



# ඕස්ට්‍රේලියාවේ වේදිකා නාට්‍යය 2

(පෙර කලාපයෙන්)

වැඩි වූ පිටිවහලුන්ගේ සහ ඔවුනගේ දෙවෙන පරම්පරාවේ ඇත්තන්ට ද, නිලධාරී පන්තියට ද, නව ජීවිතයක් සොයා පැමිණි ජනයා හට ද වෘත්තීය මට්ටමෙන් සපයන විනෝදාස්වාද ක්‍රම අවශ්‍යය විය. ක්‍රමයෙන් රංග කලාව වෘත්තීය සේවයක් බවට පත්වන්නේ ද, රංගශාලා වැඩි දියුණු වන්නේ ද එබැවිනි.

තහනමෙන් පසුව නැවත ආරම්භ කළ සිඩ්නි හි තියටර් රෝයල්, එම වසරේම, එනම් 1833 දී, වේදිකා නාට්‍යය නිෂ්පාදන දෙකක් එකම දිනක රඟ දක්වන්නේ ඉහත කී පාරිභෝගික අවශ්‍යතාවය වෙනුවෙනි. තියටර් රෝයල් ශාලාව, එම යුගයේදී ප්‍රේක්ෂකයන් 1000 කට එකවර පහසුකම් සපයනු ලැබිය.

යටත්විජිත කොලනි ජනපද ක්‍රමයෙන් ව්‍යාප්තියත් සමග, අනෙකුත් ජනපදවල, අද දිනයේ මෙල්බර්න් සහ ඇඩිලේඩ් වැනි, ප්‍රධාන නගර ආශ්‍රිතව ද රංග ශාලා අරඹනු ලැබිය නිව් සවුත්වේල් කොලනියේ පෝර්ට් පිලිප් දිස්ත්‍රික්කයේ මෙල්බර්න් නගරය 1837 දී ස්ථාපිත කරන ලද අතර, එහි බිහිවූ මුල් ගොඩනැගිලි අතර රංග ශාලාවක් ද විය. ඒ, 1838 දී විවෘත කරන ලද මෙල්බර්න් හි පළමු රංග ශාලා ව වූ A Makeshift Theatre රංග ශාලාවයි.

එයින් වසර හය හතකට පසුව කොලොනිය ලද තවත් ජයග්‍රාහී පියවරක වන්නේ, The Queens' Theatre Royal නමින් මෙල්බර්න් නගරයේ 1845 ඉදිකළ නව රංග ශාලාවයි. එම රඟහල එවකට අනෙක් කොළණි හි රංග ශාලා අභිබවන නවීන රඟහලක් විය. එහි 800 ත් 900 ත් අතර ප්‍රේක්ෂකයන් උදෙසා තට්ටු තුනකට ඉදිකළ ප්‍රේක්ෂාගාරයක් තිබුන අතර, ඉහළ මාලයේ තිබූ නළුවන්ගේ අගාරයක් ද, අභසේ සිට නළුනිළියන්ට මතුවිය හැකි යන්ත්‍රසූත්‍ර ද එහි විය.




මේ කාලය වනවිට ආර්ථික සහ සමාජීය වශයෙන් වැඩිදියුණු වන්නාවූ නිව්හෝලන්ඩ් (ඉපැරණි ඕස්ට්‍රේලියාවේ) හි කොළනි ජනපද කෙරෙහි යුරෝපාකරයේ සහ බාහිර රටවල අවධානයට යොමුවිය. වෘත්තීය රංග දැකීමට අභිලාෂය නිසා රංග ශාලා අයිතිකරුවන්ගෙන් ආරාධනයක් ලබා හෝ, ස්ව කැමැත්ත මත වෘත්තීය රංග සංචාරක කණ්ඩායම් පැමිණීම ආරම්භ කරන්නේ මෙකලය, කැනේඩියානු සංචාරක සමාගමක් 1845 දී සිඩ්නි හි The Fairy Lake නම් ඔපෙරාව රඟ දක්වයි. එම ඔපෙරාව නරඹා ආශ්වාදයට පත් සිඩ්නි නාට්‍යය නියුක්තිකයෝ ද එනුවර ප්‍රේක්ෂකයන් වෙනුවෙන් ඉපැරණි ඕස්ට්‍රේලියාවෙ හි පළමු ඔපෙරාව 1847 දී නිෂ්පාදනය කරනු ලබයි. එය Don John of Australia ඔපෙරාවයි. පළමු ඔපෙරා නිෂ්පාදනය අගය කළ යුත්තක් වුවද, උසස් රසයකින් යුතු විචාරකයන් නිසා හෝ තරගකාරී අනෙත් නගරයක නිෂ්පාදනයක් වූ නිසා ඉරිසියාවට හෝ, Port Phillip and Melbourne Advertiser නියෝජිතයන් මෙය වාර්තාකරන්නේ මෙතුවක් කාලයකට මිනිස් මනසක් අත්විදි භාව විරහිත අතාර්කික ගැම්මකට නැති රංගයක් ලෙසය.

නාට්‍යය රසය පරයා රන් වියරුව ඇතිවන්නේ ද මේ කාලයේදී ය. 1849 දී වැජ්මන් නම් ගොපලු කොලුවෙකු විසින් අහම්බෙන් සොයාගත් රන් කැටිත්තක් පිළිබඳ හෝඩුවාවෙන් පසුව සහ එඩ්වර්ඩ් හාර්ග්‍රේව්ස් එඩ්වර්ඩ් හාර්ග්‍රේව්ස් ගේ 1851 දී රන් සොයා ගැනීමෙන් පසුව, රටේ වටේ වූ කොලනිකාරයෝ ද පිටරැටි යුරෝපියෝ ද කඩිමුඩියේ රත්තරං ගරන්නට නිව් සවුත්වේල් කොලනියට සහ එහි පෝර්ට් පිලිප් දිස්ත්‍රික්කයට ගලා එන අතර, පිටිවහල් සිරකරුවෝ තවදුරත් මෙරටට නොගෙන්වන බැවින් වැඩ සහායට වින්නු ද එන්නේ මේ යුගයේදීය. ප්‍රධාන නගරවලින් පරිබාහිර ව රන් ගරනා නගර ආශ්‍රිතව විකල්ප විනෝදාස්වාද මෙකල යලිත් ජනප්‍රිය වෙයි මේ අතර මැජික් සහ සර්කස් සංදර්ශන ද මිටිමෙලවු අත්වලින් කෙරෙනා ගුටි කෙළි ද විය. වාර්තාගත එක තරගයක් පැය හයයි කාලයක් තිබු අතර, ප්‍රේක්ෂකයන් නොසතුටු කරමින්, සටන් කරුවන් විඩා වැටීමෙන් එය අවසන් වී ඇතිබව




සඳහන්ය.

රන් නිසා ඇතිවූ නව පොහොසත් පැලැන්තිය, එකල ආකර්ෂණයට ලක්වූ නළුනිළියන් සහ ප්‍රභූන් සහභාගිවන උත්සව සඳහා ද බාල් නැටුම් සඳහා ද සහභාගි වීමට කැමැත්ත දක්වන ලදී. එකල රනින් පොහොසත් වූ පුරුෂයන් ගේ එක් සිහින නළඟනක් වූයේ ලෝලා මොන්ටෙස් Lola Montez ය රංග විචාරකයන් තදින් විවේචනය කළද, ලෝලා ගේ මකුළු නැටුම නම් ප්‍රසිද්ධ නර්තන අංගය දැක කුල්මත්වූ එකී අනුගාමික පුරුෂ නරඹන්නෝ, රංගය අවසානයේදී ඇයට උපහාරයක් සේ රන් කැබිලිති වේදිකාවට විසිකළ බව සඳහන් වේ

නිව් සවුත්වේල් කොලනියේ පෝර්ට් පිලිප් දිස්ත්‍රික්කය, වික්ටෝරියා කොලනිය ලෙස නිදහසේ ආරම්භ වන්නේ 1851 දීය.

38 වන පිටුව